05 ශ්‍රේණිය - ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය


I පත්‍රය


කාලය : පැය 1යි


නම :- .....


❖ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න.


1. පහත සඳහන් 1 හා 2 ප්‍රශ්නවල වෙනස් රූපය යටින් ඉරි ගසන්න.


i. 

ii. 


iii. 

2. i. 

ii. 

iii. 

❖ පහත සඳහන් රූපය බලා අංක 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



3. වෘත්තයට අයත් ත්‍රිකෝණයට අයත් නැති එහෙත් සෘජුකෝණාස්‍රයට අයත් අංකය වන්නේ,

i. 1 ii. 2 iii. 8

4. එක් රූපයකට පමණක් අයත් අංක වන්නේ,

i. 4, 12, 14 ii. 12, 8, 14 iii. 12, 14, 6

❖ සම්බන්ධතාවයක් නොදක්වන පේලිය තෝරා ඉරක් අඳින්න.

5. i. ධිවරයා → මුහුදු → බෝට්ටුව

ii. වෛද්‍යවරයා → රෝහල → ගිලන්රථය

iii. විදුලි කාර්මිකයා → සායනය → ටෙස්ටෙරය

6. i. බෙරය → දවුල → වරක්කලය


ii. කියත → වඩුවා → නියන

iii. ගොවියා → දැකැත්ත → නියර

❖ පහත වැකියේ ඉරි ඇඳි පදයේ අදහස දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

7. ''ඒ සිද්ධිය අහලා මට හීන් දාඩිය දැම්මා'' අම්මා කීවා ය.

i. ක්ලාන්ත වීම. ii. ඇඟ සිහින් වීම. iii. දැඩි සේ බියට පත්වීම.

8. 

මෙම රූප සටහනෙහි දක්වා ඇති වර්ග සෙ. මී. 16 ක් වූ කුඩා සමචතුරස්‍රාකාර කොටස කපා ඉවත් කළ පසු ඉතිරිවන කොටසේ පරිමිතිය කොපමණද?

i. 64 cm ii. 32 cm iii. 24 cm

❖ පහත පද සමූහය සඳහා තනි පදයන් තෝරන්න.

9. සභාව අමතා කතා කරන්න.

i. සභාපති ii. මන්ත්‍රීතුමා iii. කථිකයා

10. ඇඹීමේ සිත්තරෙකු විසින් කරන නිර්මාණය,

i. මූර්තිය ii. සිතුවම iii. චිත්‍රය

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. සිරිපාල ධනපාලගෙන් ලබාගත් රු. 500 ට පොලි වශයෙන් මාසිකව රු. 50 ක් ගෙවයි. මාස 10 ක් අවසානයේ සිරිපාල ණය මුදල ගෙවා දැම්මේ ය. ධනපාල ලැබූ ලාභය කීයද?

i. රු. 5 000 යි. ii. රු. 1 000 යි. iii. රු. 500 යි.

12. සුරංගිගේ දැන් වයස දිනුෂිගේ වයසින් අඩකි. දෙදෙනාගේම වයස් වල එකතුව අවුරුදු 12 කි. තව අවුරුද්දකින් දිනුෂිගේ වයස වන්නේ,

i. අවුරුදු 9 කි. ii. අවුරුදු 13 කි. iii. අවුරුදු 5 කි.

❖ පහත කවිය ඇසුරින් අසන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

කාහටත් වරදී - ඉන් දොස් කීම වැරදී
මාහට නොවරදී - සිතන අයහට නිතර වරදී

13. නිතර වරදින්නේ,

i. කාහටත්

ii. තමන් නිවැරදිමයි සිතන අයට

iii. දොස් කියන අයට

14. වරදින්නේ කාටද?

i. දොස් කියන අයට ii. නොවරදින සිතන අයට iii. හැමෝටම

❖ පහත දැක්වෙන්නේ රහස් සංකේත ලෙස අංක අනුපිළිවෙළට යොදා ලියූ වාක්‍ය දෙකකි.

- 4, 6, 8, 3 = මම රාත්‍රීයට දත් නොමදිමි.
- 6, 7, 8, 5 = රාත්‍රියට මල්ලි දත් මදියි.

15. මෙහි ''දත්'' යන්නට දී ඇති ඉලක්කම වන්නේ,

i. 4 ii. 5 iii. 6

16. මෙහි ''රාත්‍රියට'' යන්නට දී ඇති ඉලක්කම වන්නේ,

i. 4 ii. 6 iii. 8

❖ පහත සංඛ්‍යා රටා තේරුම් ගෙන හිස්තැනට ආ යුතු සංඛ්‍යාව තෝරා ඉරක් ගසන්න.

17. ....., 9, 19, 39 i. 29 ii. 4 iii. 1

18. 1, 9, 25, 49, ... i. 64 ii. 100 iii. 81

19. නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. හොරණෑව ii. වලඳ iii. උෂ්ණ





20. නිවැරදි අදහසක් දෙන වාක්‍ය යුගළය තෝරන්න.





i. අපේ පැතුම පරම සාමය යි. එහෙත් අපි ඇප කැප වෙමු.





ii. අපේ පරම පැතුම සාමය යි. අපි ඒ සඳහා ඇප කැප වෙමු.

iii. පැතුම අපේ පරම සාමය යි. අපි එබැවින් ඇප කැප වෙමු.

❖ පහත රූප සටහන් වල පළමු රූපය හා සම්බන්ධතාවයක් ඇති රූපය තෝරන්න.

21.  i.  ii.  iii. 

22.  i.  ii.  iii. 

23.  i.  ii.  iii. 

❖ නොගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.


24. රුපියල i. යෙන් ii. ඩොලර් iii. මුදල්

25. කැවුම් i. කොකිස් ii. වැලිතලප iii. බිස්කට්

26. ලී කුට්ටිය i. අඟුරු කැබැල්ල ii. රිජිෆෝම් කැබැල්ල iii. ගල් කැටය

27. ත්‍රිකෝණය i. සමචතුරස්‍රය ii. සෘජුකෝණාස්‍රය iii. ඝනකය


28. සබරගමුව i. ඌව ii. රුහුණ iii. මධ්‍යම

29.  පහත රූපයේ ඇති කෝණ ගණන හෝ ත්‍රිකෝණ ගණන නොවන්නේ,

i. 3 ii. 9 iii. 13

30. සමචතුරස්‍රයක ඇති සමමිතික අක්ෂ ගණන වන්නේ,

i. 2 ii. 4 iii. 6

31. 

අඳුරු කළ පෙදෙස මුළු පෙදෙසින්,

i. 3 කි. ii. $\frac{6}{16}$ iii. $\frac{1}{4}$

❖ පහත වචන පේළිවල ඇති සමාන පද දෙක යටින් ඉර ගසන්න.


32. i. දූපත, දිවයින ii. යහපත්, අයපහත් iii. පාර, පාවර

33. i. සිරිත්, විරිත් ii. හිමිදිරිය, උදෑසන iii. සඳ, තරු

34. වෙළෙන්දෙක් අඹ ගෙඩි 50 ක් රු. 300.00 කට මිලදී ගත්තේ ය. ගෙඩි 5 ක් නරක් වී තිබුණි. ඉතිරි සියලු අඹ විකුණා රු. 150.00 ක් ලාභ ලබන්නට නම්, ඔහු අඹ ගෙඩියක් විකිණිය යුතු මිල කීයද?

i. රු. 10.00 ii. රු. 20.00 iii. රු. 6.00

❖ දිග හරින ලද ඝනකයක හැඩයේ පෙට්ටි දෙකක මුහුණත් පෙනෙන ආකාරය පහත දැක්වේ.



35. C මුහුණතට විරුද්ධ මුහුණතේ ඇති ඉංග්‍රීසි අකුර කුමක් ද?


i. B ii. A iii. C

36. 5 ඉලක්කම සහිත මුහුණතේ විරුද්ධ මුහුණතේ ඉලක්කම කුමක් ද?

i. 4 ii. 1 iii. 6

37. තොරණක රතු හා නිල් විදුලි බුබුළු පිළිවෙලින් මිනිත්තු 2 හා 3 වරක් දැල්වේ. මෙම දෙවර්ගයම රාත්‍රී 7 ට එකවර දැල්වුණි නම්, නැවත එකවර දැල්වෙන්නේ කීයටද?


i. පැය 00 05 ට ii. පැය 19 06 ට iii. පැය 00 00 ට


38. 


මෙම රූපය කපා ගැනීමට සෘජුකෝණාස්‍ර කඩදාසි කීවරක් නැවිය යුතු ද?

i. 1 යි. ii. 3 යි. iii. 2 යි.

❖ පහත මිල සටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.


රු. 40.00


රු. 70.00


රු. 80.00

39. කෙසෙල් ඇවරියක මිල කීය ද?

i. රු. 40.00 ii. රු. 30.00 iii. රු. 80.00

40. අඹ ගෙඩි 4 ක් හා ජම්බු ගෙඩි 4 ක මිල කීය ද?

i. රු. 140.00 ii. රු. 130.00 iii. රු. 150.00

05 ශ්‍රේණිය - ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය

II පත්‍රය

කාලය : පැය 1 යි විනාඩි 15

නම :- .....

1. පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හිරු එනකොට ආකාසේ
රන් තරු මල් කොහි යනව ද
වලාකුළක් පොරවා ගෙන
හඳහාමිත් නිදියනව ද
ගස් අස්සෙන් තීරු තීරු
එන හිරු රැස් සාරි වගෙයි
අම්මට දෙන්නට හිතුණාත්
අල්ල ගන්න බැරි ගාන යි
මල් පෙති මත මුතු පිනිකැට
අම්මට මාලෙකට හොඳයි
අහුලා ගන්න හදන කොට ම
ඒවත් කොහෙදෝ හැංගෙයි

ගායනය : තර්ෂණා මාධව පෙරේරා
සංගීතය : රෝහණ වීරසිංහ
පද : මහින්ද අල්ගම

(05 ශ්‍රේණිය ගු.මා.ස)

i. කවියේ සඳහන් පරිදි හඳහාමි නිදියන්නේ කෙසේ ද?

.....

ii. ගස් අස්සෙන් එන්නේ මොනවා ද?

.....

iii. හිරු රැස් සමාන කර ඇත්තේ මොනවාට ද?

.....

iv. මුතු පිනිකැට තිබෙන්නේ කොතැන ද?

.....

v. කවියේ සඳහන් අප්‍රාණවාචී බහුවචන නාම පදයක් ලියන්න.

.....

vi. අම්මාට මාලයක් සෑදීමට සුදුසු එහෙත් අහුලාගත නොහැක්කේ මොනවා ද?

.....

vii. සමාන පදය බැගින් ලියන්න.

අම්මා - ..... ආකාසය - .....

(ලකුණු 2×4=08)

2. පහත සඳහන් එක් එක් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

i. කිරිල්ලි ඈතට ඉගිල ගියේ ය. ( )

ii. මල්ලිත්, නංගීත් පාසල් ගියෝ ය. ( )

iii. අලුත් පොතක් ලිවීමට මම බලාපොරොත්තු වෙමි. ( )

(ලකුණු 03)

3. නිවැරදි ව ලියා ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

A. i. පුස්තකාළය ii. පුස්තකාලය iii. පුස්ථකාලය

B. i. කොට්ටාසය ii. කොට්ඨාසය iii. කොට්ඨාශය

(ලකුණු 02)

4. පහත යුගළ පද සම්පූර්ණ කරන්න.

i. තෑගි - .....

ii. කෙළි - .....

(ලකුණු 02)


5. පහත යෙදුම් වල අඩු වචනය හිස්තැනෙහි ලියන්න.


i. කළුවා ..... ගියා වගේ.

ii. ඉඟුරු දීලා ..... ගත්තා වගේ.

(ලකුණු 02)

6. පින්තූර දෙස බලා නියමිත ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

i. 

ii. 

....

(ලකුණු 02)

7. පහත වචනයේ තේරුම සිංහලෙන් ලියන්න.

Sister : .....

(ලකුණු 01)

8. පහත දී ඇති වචන ගලපා අර්ථවත් වැකියක් සාදන්න.

i. Come / I / in / may

.....

(ලකුණු 01)

9. ''අඩි මට්ටම්'' යන දෙමළ වචනයේ සිංහල තේරුම ලියන්න.


.....

(ලකුණු 01)

10. මෙම වාක්‍යය දෙමළෙන් කියන අයුරු සිංහලෙන් ලියන්න.

මට වතුර එපා :- .....

(ලකුණු 01)

11. 

රවුමේ ඇති ඉලක්කම් සියල්ලම යොදා ලිවිය හැකි කුඩාම සංඛ්‍යාව ලියන්න.

.....

(ලකුණු 02)

12. දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.
2066, 1209, 3005, 2109

.....

(ලකුණු 02)

13. දී ඇති සංඛ්‍යා රටාවේ හිස්තැනට ආ යුතු සංඛ්‍යා ලියන්න.

i. 26, 33, 40, ..., 54 ii. 2, 6, 18, 54 .....

(ලකුණු 02)

14. අඹ ගෙඩි 43 ක් හතර දෙනෙකු අතර සමව බෙදා දෙන්නට තව කීයක් (අඩු නරමින්) අවශ්‍ය ද?

.....

(ලකුණු 02)

15. පොත් 6 බැගින් ඇති තෑගි පාර්සල් 10 ක ඇති පොත් ගණන කීය ද?

.....

(ලකුණු 02)

❖ වගුවේ ඇති තොරතුරු බලා පිළිතුරු ලියන්න.

	සිංහල	ගණිතය	පරිසරය	දෙමළ
බිනුජ්	92	85	93	90
තිනුජ්	88	90	97	97
නිමන්දි	95	83	93	100
ඉරුන්දි	85	85	85	100

16. නිමන්දිගේ මුළු ලකුණු කීය ද? .....

17. බිනුජ්ගේ සිංහල ලකුණු හා ඉරුන්දිගේ දෙමළ ලකුණු අතර වෙනස කීය ද?

.....

18. මෙහි ඇති වැඩිම ලකුණ හා අඩුම ලකුණේ එකතුව කීය ද? .....

(ලකුණු 2×3=06)

19. පෙ.ව. 8.30 ට කොළඹින් පිටත් වන රුහුණු කුමාරි දුම්රිය පැය 3 යි විනාඩි 45 කට පසුව ගාල්ලට ළඟා විය. දුම්රිය ගාල්ලට ළඟා වන විට වේලාව කීය ද?

.....

(ලකුණු 02)

20. ලීටරයක් වතුර තිබූ භාජනයකින් 10 ml ක් වූ කෝප්පයකින් හතර වරක් ජලය ඉවත් කළේ නම් භාජනයේ දැන් ඇති ජල ප්‍රමාණය කොපමණ ද?

.....

(ලකුණු 02)

21. පැයට කිලෝමීටර් 100 ක වේගයෙන් යන බසයක් පැය 3 විනාඩි 15 කදී යන දුර ප්‍රමාණය කොපමණ ද?


.....

(ලකුණු 02)

22. හාල් කිලෝවක් රු. 60.00 ක් වන අතර රු. 300.00 ට ගත හැකි හාල් ප්‍රමාණය කිලෝ කීය ද?

.....

(ලකුණු 02)


23. 

ඔරලෝසු මුහුණතේ ඇති වේලාව කීය ද?

.....

(ලකුණු 02)

❖ එක් දිනක් සිසුන් පන්තියට ගෙන ආ ආහාර පිළිබඳ තොරතුරු මෙහි දැක්වේ.



24. පාන් වලට කැමති සංඛ්‍යාව සිසුන් 7 කි. එය ප්‍රස්තාරයේ දක්වන්න.

25. වැඩිම දෙනෙකු රැගෙන එන ආහාර වර්ගය කුමක් ද?


.....

26. කඩල වලට වඩා බත් ආහාරයට ගන්නා සිසුන් ගණන කීය ද?

.....


(ලකුණු 2×3=06)

27. මෙම රූපයේ පරිමිතිය කීය ද?



.....

(ලකුණු 02)

28. 

රූපයේ සඳහන් ආකාරයට තැන්පත් කර ඇති පේළි 07 කින් යුතු සිමෙන්ති ගල් කැට ගොඩේ ඇති මුළු ගල් ප්‍රමාණය කීය ද?

.....

(ලකුණු 02)

29. ප.ව. 6.30 ට ආරම්භ වන රූපවාහිනී වැඩ සටහනක් පැයක් පුරා විකාශය කරනු ලැබේ. එම වැඩසටහන අවසන් වන වේලාව සම්මත ඔරලෝසු ක්‍රමයට ලියන්න.

.....

(ලකුණු 02)

30. රු. 24.00 කට අඹ 6 ක් ගත හැකිය. රු. 60.00 කට ඇපල් ගෙඩි 3 ක් ගත හැකිය. අඹ ගෙඩි 8 ක් හා ඇපල් ගෙඩි 5 ක් ගැනීමට අවශ්‍ය මුදල කීය ද?

.....

(ලකුණු 02)

❖ අංක 31 සිට 55 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31. ඒක දේශීය ශාක වර්ගයකි.

i. පොල් ii. කොස් iii. කෙකටියා

32. ජලයෙන් ව්‍යාප්ත වන බෝග වර්ගයකි.

i. පොල් ii. කොස් iii. රඹුටන්

33. මල් පරාගනයට උපකාරී වන සතෙකි.

i. මී මැස්සා ii. වවුලා iii. දඬු ලේනා

34. ආහාර කල් තබා ගැනීම සඳහා පැරැන්නන් භාවිත කළ ක්‍රමයකි.

i. ටින් කිරීම. ii. ශීතකරණයේ තැබීම. iii. වැලි යට දැමීම.

35. පොහොර වර්ගයක් ලෙස යොදා ගත හැක.

i. පොලිතීන් ii. ප්ලාස්ටික් iii. කුකුළු අසූචි

36. ගොවිතැනට හානි කරන සතෙකි.

i. ගැඬවිලා ii. ගවයා iii. ඇටි කුකුළා

37. ශ්‍රී ලංකාවේ ඉඳි කළ පළමු වැව වන්නේ,

i. පරාක්‍රම සමුද්‍රය ii. බසවක්කුලම iii. කලා වැව

38. ආහාර අපිරිසිදු නොකරන සතෙකි.

i. සමනලයා ii. ගෙමැස්සා iii. මීයා

39. මේදය වැඩි ආහාරයකි.

i. කඩල ii. පරිප්පු iii. රට කජු

40. බෝ නොවන රෝගයකි.

i. කොරෝනා ii. පාචනය iii. දියවැඩියාව



41. ''අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු යැයි'' ප්‍රකාශ කළේ,

i. දුටුගැමුණු රජතුමා ii. මහා පරාක්‍රමබාහු රජතුමා iii. මහසෙන් රජතුමා

42. කම්කරු දිනය සමරනු ලබන්නේ,

i. ජනවාරි 1 දා ii. පෙබරවාරි 4 දා iii. මැයි 1 දා

43. පැතලි ඉස්කුරුප්පු නියනෙන් තද කළ හැකි ඇණ හිස වන්නේ,

i.  ii.  iii. 

44. අතීතයේ ජීවත් වූ මිනිසුන් සන්නිවේදනය සඳහා භාවිත කළ ක්‍රමයක් නොවන්නේ,

i. ගුවන් විදුලිය භාවිතය. ii. කොඩි එසවීම. iii. හූ කීම.

45. වවුලන් මගින් බෝ විය හැකි ශාකයකි.

i. පොල් ii. පුවක් iii. දෙල්

46. ශ්‍රී ලංකාවේ ජාතික ගීය නිර්මාණය කළේ,

i. ආනන්ද සමරකොන් මහතා

ii. එස්. මහින්ද හිමි

iii. D. S. සේනානායක මහතා

47. ටෝච් බල්බයක් සහ බැටරියක් සම්බන්ධ කිරීමට අවශ්‍ය අඩුම වයර් ගණන,

i. 1 ii. 2 iii. 3

48. කළු ගඟ මුහුදට වැටෙන්නේ කුමන පළාතෙන් ද?

i. මධ්‍යම ii. දකුණු iii. බස්නාහිර

49. කංකුං බෝ කිරීමට අවශ්‍ය වන්නේ,

i. බීජ ii. දඬු iii. මල්

50. 

මෙම රූපයේ දැක්වෙන අප රටට කීර්තියක් ගෙන දුන් පුද්ගලයා කවුද?

i. ආනන්ද කුමරස්වාමී මහතා

ii. ටී. බී. ජයා මහතා

iii. ආතර් සී. ක්ලාක් මහතා

51. සුළං ආධාරයෙන් හඬ නංවන සංගීත භාණ්ඩයකි.

i. සර්පිනාව ii. යක්බෙරය iii. තලම්පට

52. කුඹල් කර්මාන්තයේදී යොදා ගන්නා උපකරණයකි.

i. සකපෝරුව ii. වරක්කලය iii. මුළු මට්ටම

53. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් තුන් සිංහලයේ රජු ලෙස ඔටුණු පැළඳි ජාතික වීරවරයා කවුද?

i. මොනරවිල කැප්පැටිපොළ දිසාව

ii. වීර පුරන් අප්පු

iii. ගොංගාලේගොඩ බණ්ඩා

54. භාවාගේ ගමන් විලාසය ගැන කියවෙන වන්නම වන්නේ,

i. තුරඟා වන්නම ii. මුසලඩි වන්නම iii. ගජඟා වන්නම

55. රාජ්‍ය ලාංඡනයේ ඇති වී කරල් වලින් නිරූපණය වන්නේ,

i. සෞභාග්‍ය ii. ධාර්මික බව iii. ස්වයං පෝෂිත බව

(ලකුණු 1×25=25)

56. ආහාර නිෂ්පාදනයේ දී කෘමී නාශක, වල් නාශක භාවිත කිරීම අද බහුල ලෙස දක්නට ඇත. එම නිසා මිනිසුන් මෙන්ම සතුන් ද ගැටලු රැසකට මැදි වී ඇත. ඇළ දොළ, ගංගාවලට පවා වස විස මුසු වී ඇත. අපේ අතීත මිතුන් මිත්තෝ වස විස වෙනුවට පරිසර හිතකාමීකම යොදා ගෙන ආහාර නිපදවා රට ස්වයං පෝෂිත කළහ. මේ ගැන සිතා බලා,

''වස විසෙන් තොරව ආහාර වගා කරමු'' යන මාතෘකාව යටතේ වාක්‍ය 5 ක් ලියන්න.

(සෑම වාක්‍යයකටම වචන 5 කට නො අඩු විය යුතුය. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. .....

.....

2. .....

.....

3. .....

.....

4. .....

.....

5. .....

.....

(ලකුණු 2×5=10)

• නිවැරදි අත් අකුරු, ඉලක්කම් හා පැහැදිලි බවට ලකුණු 02 ක් ප්‍රදානය කරන්න.